අලෙවි කරණය

# ලූණු මිරිසේ වෙළඳ පොල

මෙරටේ ජනතාවගේ එදිනෙද ආහාර පිළියෙල කිරීමේදී වියළි මිරිස් අර්තාපල්, හා රතු ලූනු වලට වැදගත් ස්ථානයක් හිමිවේ. මේ සඳහා වාර්ෂික දේශීය ඉල්ලුම වියළි මිරිස්, රතුලූනු හා අර්තාපල් වලට පිළිවෙලින් මෙ: ටොන් 38000,81000,69000 පමණ වේ. වැඩිවන ජනශහණය නිසා වාර්ෂිකව වියළි මිරිස් හා රතුලූනු සඳහා මෙ: ටොන් 1000 ප්‍රමාණයක නිෂ්පාදන වැඩිවීමක් අවශ්‍ය වේ. අර්තාපල් පරිභෝජනයේ විශාල වැඩිවීමක් මෑත වර්ෂවලදී දක්නට ලැබේ. වර්ෂ 1971-75 පස් අවුරුදු කාලය තුළ දේශීය සාමාන්‍ය වාර්ෂික පරිභෝජනය මෙ: ටොන් 40000ක් වුවත් 1976-1980 සාමාන්‍ය වාර්ෂික පරිභොජනය මෙ: ටොන් 52000 කි. මේ අනුව වාර්ෂිකව මෙ: ටොන් 2000 පමණ නිෂ්පාදන වර්ධනයක් වැඩිවන ඉල්ලුමට අවශ්‍ය වේ.

දේශීය වෙළඳ පලේ මිළ ඉතා ඉහළ මට්ටමක පවතින විටෙක හා සිංහල අවුරුදු හෝ නත්තල් සමය වැනි විශේෂ කාලවලදී පමණක් මෙම ද්‍රව්‍ය ආනයනය කිරීමේ පියවරක් රජය විසින් ගනු ලැබේ. පසුගිය පස් අවුරුදු කාලය තුළ දේශීය මුළු සැපයුමෙන් වියළි මිරිස්, රතු ලූනු, හා අර්තාපල් පිළිවෙලින් 20.7%, 18.7% හා 7.57% පමණ පිටරටින් ගෙන්වා තිබේ. එහෙත් 1982 වර්ෂය තුළ විශේෂයෙන් රතු ලූනු හා අර්තාපල් ගෙන්වීම බොහෝ දුරට අඩුවී ඇති බව පෙනේ. පළමු සිව් මස් කාලය තුළ රතුලූනු මෙ: ටොන් 450 ක් හා අර්තාපල් මෙ: ටොන් 450 ක් පමණ ගෙන්වා ඇත්තේ නමුත් වියළි මිරිස් දේශීය වෙළඳපල මිළ ඉහළ යාම වරින් වර සිදුවූ බැවින් පළමු අර්ධ වර්ෂය තුළ මෙ: ටොන් 4691 ක් ගෙන්වා ඇත. රජය විසින් දේශීය නිෂ්පාදන වලට ප්‍රමුඛත්වය දෙන

පර්යේෂණ හා පුහුණු කිරීමේ
නිලධාරි

## ඩබ්ලිව්. ඒ. ජයරත්න
## විසිනි

අරමුණින් පෞද්ගලික අංශයට නිදහස්ව ආනයනය කිරීමට ඉඩ නොදී රාජ්‍ය ආයතනවලට දේශීය වෙළඳ පල තත්වයන් සලකා බලා පමණක් ආයත කර බෙද හැරීමට පියවර ගෙන තිබේ.

මෙම ගොවි ද්‍රව්‍ය තුන සඳහා ගොවියා දිරිමත් කරවීම රජයේ විශේෂ අවධානය යොමු වී ඇත. නිෂ්පාදන පිරිවැය, දේශීය ගොවියා ලබන මිළ, විදේශීය වෙළඳපල මිළ, ආදී කරුණු පදනම් කරගෙන ගොවියාට සාධාරණ මිලක් ලැබෙන සේ අවම මිළ ක්‍රමයක් (අර්තාපල් සඳහා හැර) ක්‍රියාත්මක කිරිම, රජයේ ආයතන කීපයක්ම නිෂ්පාදකයාගෙන් පෞද්ගලික අංශය සමග තරඟකාර මිළට ගැනීමට යෙදවීම, නිෂ්පාදන අධික කාල වලදී (විශේෂයෙන් වියළි මිරිස්) මිළට ගෙන ගබඩා කිරිම, ආයාත කිරීම, දේශීය වෙළඳපල මිළ පාරිභෝගිකයාට ඉතාමත් අධික ලෙස පවතින විටක පමණක් කිරීමට වග බලා ගැනීම, ආදිය මෑත කාලයේ රජයේ ප්‍රතිපත්තීන් වී ඇත.

සාමාන්‍ය නිෂ්පාදන වර්ෂයක් සලකා බලන විට දේශීය වෙළඳ පලේ වියලි මිරිස් මිළ පහළ යාමෙ කාලපරිච්ඡේද දෙකක් දක්නට ලැබේ. එනම් පෙබරවාරි, මාර්තු හා සැප්තැම්බර්, ඔක්තෝබර් කාල යයි. යල් කන්නයේදී ජල සම්පාදිත ඉඩම් වල මිරිස් වගා කිරිම ඉතා වැදගත් අතර ප්‍රධාන දිස්ත්‍රික්ක වශයෙන් යාපනය, කලාවැව ප්‍රදේශය, පොළොන්නරුව, මුලතිව්, කුරුණෑගල සැලකිය හැකිය. මහ කන්නයේ වැසි දියෙන් මිරිස් වගා කිරිම වැදගත් වන අතර එම දිස්ත්‍රික්ක වශයෙන් අනුරාධපුර, හම්බන්තොට, කුරුණෑගල හා මොනරාගල වැදගත් වේ. අළුතින් මිරිස් වගා කරන ප්‍රදේශයක් ලෙස මහ වැලි ප්‍රදේශයද සැලකිය හැකිය.

වර්තමානයේ වියලි මිරිස් මිළට ගැනීම ගබඩා කිරීම හා බෙදා හැරීමේදී පෞද්ගලික අංශය වැදගත් කාර්ය භාරයක් ඉටු කරනු ලැබේ. රජයේ ආයතන වශයෙන් වී අලෙවි මණ්ඩලය අවම මිළ ක්‍රමය යටතේ වියලි මිරිස් මිළට ගැනීමට ඉදිරිපත් වී සිටී. පළමුවැනි ශ්‍රේණියේ වියලි මිරිස් කිලෝවක් රු: 21.00 සෘජුවම මිළට ගැනීමේ මධ්‍යස්ථාන වලින් හෝ එහි නියෝජිත මිළට ගැනුම් මධ්‍යස්ථාන වන සමුපකාර මාර්ගයෙන් 1981/82 මහ කන්නයේදී මිළට ගැනීමට සැලසුම් කර තිබුනි. අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව හා මාක්ෆෙඩ් විසින් ඔවුන්ගේ මිළ තීරණ කිරීමේ කොමිටි විසින් නිර්දේශිත මිළ ගණන් වලට වියලි මිරිස් මිළට ගෙන බෙදා හැරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කර ඇත. මෙම ආයතන අනුගමනය කරන්නේ දේශීය වෙළෙඳ පල මිළ ගණන් අනුව ගතික මිළ ක්‍රමයකි. මේ හැරුණු විට මහවැලි සංවර්ධන මණ්ඩලය විශේෂයෙන් මහවැලි ප්‍රදේශයේ නිෂ්පාදිත මිරිස් මිළට ගෙන සමුපකාර තොග වෙළෙඳ ආයතනය මාර්ගයෙන් බෙදාහැරීමේ ක්‍රමයක් අනුගමනය කරයි.

කෙසේ වුවද පෞද්ගලික අංශය වෙළෙඳපලට පැමිණෙන දේශීය වියලි මිරිස් වලින් 90% වඩා ප්‍රමාණයක් මිළට ගැනීම හා බෙදා හැරීමේ කාර්යයට සම්බන්ධ වී ඇත. වියලි මිරිස් රතුලූනු හා අර්තාපල් මෙන්ම අනෙකුත් බෝග සඳහාද පිටකොටුව තොග වෙළෙඳ පල ඉතා වැදගත් බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියාත්මක වේ. නුවරඑළිය, බදුල්ල, වැලිමඩ හා යාපනය ප්‍රදේශවලින් අර්තාපල් තොගද ඉහතින් දක්වන ලද නිෂ්පාදන දිස්ත්‍රික්ක වලින් රතුලූනු හා වියලි මිරිස්ද කොළඹ තොග වෙළෙඳපලට ලැබේ. නිෂ්පාදන ප්‍රදේශවල තොග එකතු කරන්නන්ද ඇතැම් ගොවීන් සෘජුවමද නිෂ්පාදන එවනු ලැබේ. 4 වන හා 5 වන හරස් වීදීන්ද, ඕල්ඩ්මුවර් හා ඩැම් වීදියද කොමිස් ක්‍රමයට මෙසේ එවනු ලබන නිෂ්පාදන අලෙවි කිරීමේ වෙළඳුන් 100 ආසන්න සංඛ්‍යාවක් ඒකරාශි වී සිටී. මිරිස් සහ රතු ලූණු සඳහා දළ වශයෙන් විකුණුම් මිළෙන් 5% ක කොමිස් මුදලක් සපයන්නන්ගෙන් අයකරනු ලැබේ.

වියළි මිරිස් සඳහා ප්‍රධාන වශයෙන් ශ්‍රේණිගත කිරීම් 3ක් දක්නට ඇත. මේ සඳහා තොග වෙළඳුන් පදනම් කර ගන්නේ මිරිස් වල වර්ණය, තෙත සහිත බව, මිරිස් කරලක ප්‍රමාණය වැනි කරුණුයි. පළමු ශ්‍රේණිය, මධ්‍ය ශ්‍රේණිය, හා දෙවෙනි ශ්‍රේණිය වශයෙනි. හොඳින් වියලුණු සිහින් දිගු රතු පැහැති මිරිස් පළමු ශ්‍රේණිය ලෙස සැළකේ. මෙම ශ්‍රේණියේදී සුලු සුලු වෙනස් කම් අනුව උප ශ්‍රේණිකර විකුණුණු දක්නට ලැබේ. කොළඹ තොග වෙළඳ පොලෙන් මෙම ශ්‍රේණිය සඳහා වැඩි ඉල්ලුමක් ලැබෙන්නේ නුවර, බදුල්ල, නුවරඑළිය වැනි උඩරට ප්‍රදේශ සහ කොළඹ, හලාවත, මීගමුව, කළුතර වැනි මුහුදුබඩ ප්‍රදේශවලිනි. කෙසේ වුවද පළමු ශ්‍රේණියේ මිරිස් කිලෝවක මිළ රු: 25.00 පමණ අධික වන විට වැඩි ඉල්ලුමක් යොමුවන්නේ මධ්‍ය ශ්‍රේණියේ වියලි මිරිස් වලටයි. තත්වයෙන් තරමක් බාල මෙම ශ්‍රේණියේ කිලෝවක් සඳහා වෙළෙඳ පල මිළ පළමු ශ්‍රේණියට වඩා රු: 3.00 ක් 4.00 ක් අඩුවේ. විශේෂයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ ජනාකීර්ණ නගරවල හා අනෙකුත් නගරබද ප්‍රදේශවල කුඩුකරන ලද වියලි මිරිස් ජනප්‍රියවී ඇත. මෙසේ අඹරන ලද වියලි මිරිස් සපයන ව්‍යාපාරිකයින් වැඩි වශයෙන් ඉල්ලුම් කරන්නේ මධ්‍ය ශ්‍රේණියේ, වියලි මිරිස්ය. එය ආර්ථික වශයෙන් වාසිදයක නිසාය. විවෘත වෙළෙඳපලට අලෙවි කරන්නෝද වියලි මිරිස් මිළ ඉහල මට්ටමක පවතින විට මධ්‍ය ශ්‍රේණිය සඳහා වැඩි අවධානයක් යොමු කරයි. 2 වෙනි ශ්‍රේණියේ වියලි මිරිස් තත්වයෙන් බාල සුදු කරල් සහිත තොග ඇතුළත්ය. මෙම තොගවලට වෙළෙඳපල මිළ බොහෝ විට පළමු ශ්‍රේණියට වඩා 1/3 කින් පමණ අඩුවේ. ඉතාම අඩු ඉල්ලුමක් මේ සඳහා දක්නට ලැබේ.

හොඳින් වියලුන වියලි මිරිස් තොග තෙත රහිත ස්ථානයක මාස කීපයක් වුවද ගබඩා කර තැබීමට පුළුවන. ආර්ථික ශක්තියක් ඇති ගොවීන් ඉහළ වෙළෙඳපල මිළක් අපේක්ෂාවෙන් තොග ගබඩාකර තබනු ලැබේ. ගෝනි සහ තල කොළ ආදියෙන් තැනූ පෙට්ටිවල අසුරා ගබඩා කරනු ලබන යාපනයේ ගොවියා මීට නිදසුන්ය. මේ හැරුණු විට අතර මැදි වෙළඳුන්ද තොග ගබඩා කර තැබීමේ කාර්යයෙහි නියුක්තව සිටී. ස්වාභාවික වියලීමෙන් වන බර අඩුවීම ගොවීන් මේ සඳහා පෙළඹීම අඩු වන සාධකයකි. [ප්‍රධාන රතුලූනු නිෂ්පාදන ප්‍රදේශ වශයෙන් යාපනය, මුලතිව්, රත්නපුරය හා කුරුණෑගල යන දිස්ත්‍රික්ක වැදගත් වේ. මෙයින් යාපනය හා මුලතිව් දිස්ත්‍රික්ක වැඩිපුර ඉඩම් ප්‍රමාණයක් යල මහ දෙකන්නයේම ජල සම්පාදිත ඉඩම්වල වගා කරනු ලැබේ.] දේශීය වෙළෙඳපලේ රතුලූනු මිළ පහල බසින කාලපරිච්ඡේද දෙකකි. එනම් ජූලි, අගෝස්තු, දෙසැම්බර් හා පෙබරවාරි, මාර්තු කාලයයි. නිෂ්පාදන ප්‍රදේශවලින් කොළඹ තොග වෙළෙඳ පලට ලැබෙන රතුලූනුපරිභෝජනය කරන ප්‍රධාන ඉල්

ලුම් කලාප කීපයකි. කොළඹ දිස්ත්‍රික්යේ ප්‍රධාන ජනාකීර්ණ නගර, මහනුවර, නුවරඑළිය වැනි කඳුරට ප්‍රදේශ, කළුතර, හලාවත, මීගමුව වැනි මුහුදු බඩ ප්‍රදේශ වේ. රජය විසින් රතුලූනු සඳහා අවම මිළ ක්‍රමයක් ඇති කර තිබේ. 1982 වර්ෂයේ පෙබරවාරි ජූලි කාලය සඳහා කිලෝවකට රු: 3.75 ක් ද, අගෝස්තු සිට පසු වර්ෂයේ ජනවාරි කාලය තුළ රු. 4.00 ක් ද ලෙසයි.

එසේ වුවද රජයේ ආයතන දේශීය වෙළෙඳපලෙන් මිළට ගෙන බෙදා හරින්නේ ඉතාමත් සුළු ප්‍රමාණයකි. ආයාත කිරීම බොහෝ දුරට සීමාකර ඇත. වේදලන් වර්ගයේ රතුලූනු සඳහා වැඩි ඉල්ලුමක් ඇත්තේ සංචාරක හෝටල්, සාමාන්‍ය හෝටල්, ආපනශාලා ආදියෙනි. එසේම කොළඹ දිස්ත්‍රික්කයේ මේ සඳහා වැඩි ඉල්ලුමක් තිබේ. කුඩා වර්ගයේ රතුලූනු සඳහා වැඩි ඉල්ලුමක් ඇත්තේ කොළඹින් දුර බැහැර ප්‍රදේශවලින් කොළඹ තොග වෙළෙඳපලට පැමිණෙන වෙළඳුන් වේදලන් වර්ගය මිළට ගැනීමට එතරම් කැමැති නොවන්නේ කල් තබා ගැනීමට අපහසු බව ඔවුන් විශ්වාස කරන බැවිනි.

කෙසේ වුවද ගොවීහුද වෙදලන් වර්ගය හැකිතරම් ඉක්මනින් වෙළෙඳපලට එවීමට වැඩි කැමැත්තක් දක්වති. ඊට හේතුව වියලි බර අඩු වීමෙන් වන හානිය මග හරවා ගැනීමටයි. එහෙත් කුඩා වර්ගයේ රතුලූනු ගබඩා කර තැබීමේ ක්‍රමයක් ගොවීන් අතර දක්නට ලැබේ. යාපනයේ ගොවීන් හොඳින් පැසුණු ලූනු කොළ සහිතව ගලවා කිලෝ 15, 20 පමණ මිටි බැඳ තෙත රහිත ස්ථාන වල තබනු ලැබේ. මේ ක්‍රමයට මාස 2 ක් 3 ක් පමණ තැබිය හැකි බැව් ගොවීන්ගේ අත්දැකිමයි. මේ හැරුණු විට යාපන ප්‍රදේශයේ ඇතැම් සමුපකාර සමිති සතුව ස්ථිර ගොඩනැගිලි සහිතව ගබඩා (Godown) දක්නට ඇත. ලී දඬු උපයෝගී කරගෙන තට්ටු කීපයක් සාදා ඒ ඒ තට්ටුවල රතුලූනු සුරක්ෂිතව අසුරා තබනු ලැබේ. මේ ක්‍රමයට මාස 5 ක් 6 ක් පමණ ගබඩාකර තැබිය හැකිය. කෙසේ වුවද රතුලූනු අස්වැන්න නෙලන කාලයට වෙළඳපල මිළ ඉතා පහල වැටීමත් හිඟ කාලයට අධික මිලක් පාරිභොගිකයාට ගෙවීමට සිදුවීමත් තවමත් නොවිසිඳී ඇති ගැටළුවකි.

රතුලූනු වෙනුවට බොම්බයි ලූනු ආදේශකයක් ලෙස පාරිභොගිකයින් මිළට ගැනීම එතරම් ජනප්‍රිය බවක් නොපෙනේ. ඊට ප්‍රධාන හේතුව බොම්බයි ලූනු මිළ තරමක් රතුලූනු වලට වඩා අධික බැවිනි. තවත් වැදගත් කරුණකි. ඇතැම් ප්‍රදේශවලින් කොළඹ තොග වෙළෙඳපලට ලැබෙන වේදලක් වර්ගයේ රතුලූනු තරමක් විශාල නිසා සංචාරක හෝටල් පවා බොම්බයි ලූනු වෙනුවට ආදේශකරනු ලැබේ. කෙසේ වුවද බොම්බයි ලූනු වගාව තවම සාර්ථක මට්ටමක ලංකාවේ නොමැති නිසා ආයාත කෙරේ වැඩි නැඹුරුවක් ඇත. මේ අනුව 1982 මුල් සිව්මස තුළ මෙ: ටොන් 4450 ක් පිටරටින් ගෙන්වා ඇත.

අර්තාපල් පරිභෝජනයේ සැලකිය යුතු වැඩිවීමක් මෑත වර්ෂවල දක්නට ලැබේ. වෙළෙඳපලට පැමිණෙන අර්තාපල් ප්‍රධාන කාල පරිච්ඡේද 3 ක් ඇත. මැයි, ජූනි, ජූලි මාස වලදී නුවරඑළිය ප්‍රදේශයෙන්ද, අගෝස්තු, සැප්තැම්බර් වැලිමඩ ප්‍රදේශයෙන්ද, දෙසැම්බර්, ජනවාරි යාපන ප්‍රදේශයෙන්ද අර්තාපල් තොග වෙළෙඳ පලට ලැබේ. අර්තාපල් සඳහාද ඉතාම වැදගත් පරිභෝජන කලාප වන්නේ කොළඹ දිස්ත්‍රික්කය ප්‍රමුඛ ජනාකීර්ණ නගරයි. විශේෂයෙන්ම සංචාරක හෝටල්, සාමාන්‍ය හෝටල් ආපනශාලා හා ආරෝග්‍යශාලා, වැඩියෙන් මිළට ගනී.

වෙළෙඳපලේ වැඩි ඉල්ලුමක් ඇත්තේ නුවරඑළිය ප්‍රදේශයේ අර්තාපල් සඳහායි. කල්තබා ගැනීමේ හැකියාව හා රසයේ උසස් මට්ටමක පවතින බව මිළට ගන්නන්ගේ මතයයි. විශේෂයෙන්ම යාපන ප්‍රදේශයේ අර්තාපල් නියමිත ලෙස මේරීමට පළමු ගලවා වෙළෙඳපලට එවීම නිසා කල් තබාගැනීමට අපහසු බව වෙළෙන්දෝ විශ්වාස කරති. විවෘත වෙළෙඳපලේ නුවරඑළිය ප්‍රදේශයේ අර්තාපල් සඳහා තරමක ඉහල මිළක් ලැබේ. දුර පළාත්වලින් කොළඹට පැමිණෙන වෙළෙඳුන් මෙම තොග මිළට ගැනීමට කැමති වෙන්නේ තරමක් කල් තබා ගැනීමට ඇති හැකියාව නිසාය.

කෙසේ වුවද අර්තාපල් ගොවීන් තම තොග ගබඩා කර තබා ගැනීමේ පුරුද්දක් සාමාන්‍යයෙන් නැත. එසේ වුවද නුවරඑළිය ප්‍රදේශයේ ඇතැම් ගොවීන් හොඳින් සැකසූ නියමිත ලෙස මේරූ පලදාව ඉවත් කොට සති කීපයක් හෝ මාසයක් පමණ සුරක්ෂිතව ගබඩා කර තබා ඉහළ මිළකට වෙළෙඳපලට එවනු දක්නට ලැබේ. එහෙත් ප්‍රවාහනය කිරීමේදී අර්තාපල් අපතේ යාම තවත් වැදගත් ගැටලුවක් වෙයි.

## 1982 වර්ෂයේ පසුගිය මාස තුනක කොළඹ පිටකොටුවේ පැවති තොග හා සිල්ලර මිල ගණන්

| | ජූනි | | | | ජූලි | | | | අගෝස්තු | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | තොග මිල (කිලෝවක් – රුපි.) | | සිල්ලර මිල (කිලෝවක් – රුපි.) | | තොග මිල (කිලෝවක් – රුපි.) | | සිල්ලර මිල (කිලෝවක් – රුපි.) | | තොග මිල (කිලෝවක් – රුපි ) | | සිල්ලර මිල (කිලෝවක් – රුපි ) | |
| වියලි මිරිස් | 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 |
| 1 ශ්‍රේණිය | 18.00-24.00 | 18.00-25.00 | 22.00-[illegible]5.00 | 21.00-27 00 | 20.00-25.00 | 21 00-25.00 | 22.00-28.00 | 25.00-28.00 | 21.00-25.00 | 19.00-22.00 | 25.00-28.00 | 21.00-25.50 |
| රතුලූණු වේදලන් | 4 80- 5.50 | 4.80- 8.00 | 6.00- 8 00 | 6.50- 9.50 | 7.00-10.50 | 7 50- 9.00 | 8 50-11.00 | 8.50- 9.50 | 7.50- 9.00 | 5.30 | 8.50- 9.50 | 7.00 |
| සාමාන්‍ය | 3.00- 4.50 | 3.00- 6.00 | 5.00- 6.50 | 5.00- 7 50 | 5.50- 7·00 | 6.50- 7.50 | 6.00- 8.00 | 7.50- [illegible].50 | 6.50- 7.50 | 3.70 | 7.50- 9.00 | 5.00 |
| අර්තාපල් | 8.00-10.00 | 8.00-10.00 | 9.00-11.00 | 9.00-10.50 | 11.00-12.50 | 9.00-12.00 | 12.00-13.50 | 10.00-14.50 | 9.00-13.50 | 8.00 | 10.00-14.50 | 9.00 |

1. මුල් සති දෙක තුළ.
2. අග සති දෙක තුළ.

මූලය: අලෙවි පර්යේෂණ ඒකකය – ගො. පරි. පු. ආයතනය.